(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 99. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 ඔක්තෝබර් 07 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** ප්‍රවාහන අමාත්‍යතුමිය

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **නසීර් අහමඩ් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු **ගෝවින්දන් කරුණාකරම් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **සාගර කාරියවසම් මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු **උදයන කිරිඳිගොඩ මහතා**

ගරු **ගෙවිඳු කුමාරතුංග මහතා**

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සූ. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා විසින් (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 09 දිනැති අංක 2222/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා එම නියමය, වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සභාපති ගරු මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා විසින් දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව වෙත යොමු කරන ලද ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

රුවන්වැල්ල, ලෙවන්ගම, අංක එච්/18/1 දරන ස්ථානයෙහි පදිංචි වයි. සුසිලා පද්මිණී මහත්මියගෙන් ලැබුණු 2021.06.29 දිනැති පෙත්සම ගරු සුදත් මංජුල මහතා විසින් පිළිගන්වන ලදී

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. විසර්ජන:** මුදල් අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2022 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුලා ප්‍රතිපාදන සැපයීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 නොවැම්බර් 12 සිකුරාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද එය මුද්‍රණය කළ යුතු යැයි ද රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන):** අධිකරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— (25 වන අධිකාරය වූ) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් 21 බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතු යැයි ද එය මුද්‍රණය කළ යුතු යැයි ද අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන):** අධිකරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 ඔක්තෝබර් 21 බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතු යැයි ද එය මුද්‍රණය කළ යුතු යැයි ද අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1):** ගරු වේලු කුමාර් මහතා, ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"යූඑන්වී පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**8. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2):** ගරු ඉම්රාන් මහරූෆ් මහතා, ගරු නලින් ප්‍රනාන්දු මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

''අකුරණ බයිතුස් සකාත් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.''

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**9. ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය''යි අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා. 11.35 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

''ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි ගරු වේලු කුමාර් මහතා ස්ථිර කරමින්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.30 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය. )

(අ.භා. 4.19 ට කථානායකවරයා මූලාසනාරූඪ විය. )

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය''යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය

අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 1 වැනි පිටුවේ 3 සහ 4 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමට:—

| | |
|---|---|
| ''ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය | 1. මේ පනත 2021 අංක දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2022 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.'' |

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වැනි වගන්තියේ සිට 4 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

5 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 26 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ලියාපදිංචි වීම සඳහා 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව එම තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය පිහිටා ඇති මැතිවරණ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 3 වන පිටුවේ 1 වන පේළියේ සිට 9 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමට:—

> "(3) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට සුදුසුකම් ලත් සෑම තැනැත්තකු විසින්ම පහත දැක්වෙන ලේඛන ද සමඟ එම ඉල්ලීම 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව එම තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය පිහිටා ඇති මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය -:
>
> (අ) එම තැනැත්තාගේ උප්පැන්න සහතිකයේ පිටපතක්; හෝ
>
> (ආ) එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 1 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමට:—

> "(8) හිමිකම්පෑම් හා විරෝධයපෑම් පිළිබඳව තීරණය කිරිම සඳහා මේ පනතේ අදාළ වන යම් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ වගන්තිය යටතේ වන යම් හිමිකම්පෑම් සහ විරෝධයපෑම් සඳහා අදාළ විය යුතු ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 12 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමට:—

> "කිරීමෙන් පසු, එම ලැයිස්තු සහතික කරන ලද පරිපූරක නාමලේඛනය ලෙස හඳුන්වනු ලැබිය යුතු අතර, එය එම මැතිවරණ කොට්ඨාසය සඳහා වූ මැතිවරණ නාමලේඛනයට ඇමුණුමක් ලෙස අමුණනු ලැබිය යුතු ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 14 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමට:—

"(10) 20අ වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ යම් පරිපූරක නාමලේඛනයක් සහතික කරනු ලැබූ විට ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් එම නාම ලේඛනය සහතික කරනු ලැබූ බවට ගැසට් පත්‍රයෙහි සහ එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ දැන්වීමක් පළකිරීමෙන් එම නාමලේඛනය සහතික කර ඇති බව දැනුම් දිය යුතු ය.

(11) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ සහතික කරන ලද පරිපූරක නාමලේඛනය, 10 වන උපවගන්තියේ සඳහන් නිවේදනය ගැසට්පත්‍රයේ පළ කරනු ලබන දිනයේ දී බලාත්මක විය යුතු අතර 15 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 18 වන වගන්තිය අනුව පසු කාලයක දී කරනු ලැබිය හැකි යම් වෙනස් කිරීම් වුවහොත්, ඒවාට යටත්ව සහතික කරන ලද ඊලඟ නාමලේඛනය බලාත්මක වීමෙන් නිෂ්ප්‍රභා වනතෙක් එම සහතික කරන ලද පරිපූරක ලේඛනය තවදුරටත් බලාත්මකව පැවතිය යුතු ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 15 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය සභා සම්මත විය.

**අලුත් වගන්ති**

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ සංශෝධනයක්: 1 වන පිටුවේ 24 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමට:—

"ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ජනවාරි මස තිස් එක් වන දින" යන වචන වෙනුවට "සැප්තැම්බර් මස තිස් වන දින" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

"වගන්තිය දෙවැනිවර කියවිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා යෝජනා කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 20 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමට:—

"24අ වන වගන්තිය ඇතුළත් කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 24අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

විධාන නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව සතු බලතල

24අ. මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අදාළව යම් දුෂ්කරතාවයක් හෝ කලින් අපේක්ෂා නොකළ කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ වෙනස් කිරීමක් සිදුකිරීම සඳහා හෝ යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් තීරණය කිරීම හෝ වෙනස් කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන විධාන නිකුත් කළ හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ "ඡන්ද හිමි නාමලේඛනය" යන යෙදුමේ අර්ථනිරූපණයෙහි "යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා" යන වචන වෙනුවට "20අ වන වගන්තිය යටතේ සකස් කරන ලද සහතික කරන ලද පරිපූරක නාමලේඛනය ඇතුළුව යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ;

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ-:

(1) උපලේඛනයේ "අ" වන ආකෘතියෙහි (2) වන, (3) වන සහ (5)(ii) වන අයිතමයන්හි "19....... ක් වූ ජූනි මස 1 වන දින" යන වචන සහ අංක වෙනුවට "20......ක් වූ පෙබරවාරි මස 1 වන දින" යන වචන සහ අංක ආදේශ කිරීමෙන්;

(2) උපලේඛනයේ "ආ" වන ආකෘතියේ (2) වන, (3) වන සහ (5)(ii) වන අයිතමයන්හි "19.....ක් වූ ජූනි මස 1 වන දින" යන වචන සහ අංක වෙනුවට "20.....ක් වූ පෙබරවාරි මස 1 වන දින" යන වචන සහ අංක ආදේශ කිරීමෙන්"."

නිශ්චිත කාලසීමාවක් සඳහා වූ පරිපූරක ලැයිස්තුව

10. (1) 3 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, 2021 ජූනි මස පළමුවන දින සිට මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින දක්වා වන කාලසීමාව ඇතුළත යම් දිනයක දී වයස අවුරුදු දහඅටට එළඹෙන්නා වූ යම් තැනැත්තකු, ඡන්ද හිමියකු වශයෙන් ඡන්ද හිමි නාමලේඛනයේ එකී තැනැත්තාගේ නම ඇතුළත් කරවා ගැනීමට හෝ තබා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු අතර, එවැනි සෑම තැනැත්තකු විසින් ම 20අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛන ද සමඟ එම තැනැත්තාගේ සුදුසුකම් ලැබීමේ ලිපිනය පිහිටා ඇති මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(2) සෑම ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් ම, (1) වන උපවගන්තියේ සඳහන් වන කාර්යය සඳහා පරිපූරක ලැයිස්තුවක් සකස් කරනු ලැබිය යුතු අතර එම පරිපූරක ලැයිස්තුව සකස් කිරීම සඳහා 20අ වන වගන්තියේ (5) සිට (11) දක්වා වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.''

''වගන්ති දෙවැනිවර කියවිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්ති පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

''ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය''යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**10. සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දෙවැනිවර කියවිය යුතු ය''යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය''යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

''ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

''පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය''යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**11. සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියෝගය:** කම්කරු අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1958 අංක 15 දරන පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු 46 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021.09.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. කල් තැබීම (කලාකරුවන්ගේ නිර්මාණ අයිතිය ආරක්ෂා කිරීම සඳහා ස්වාධීන ආයතනයක්):** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතු ය''යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

''ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.05 ට ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වෙලාව අ.භා. 5.30 පසුකර තිබූයෙන් අද දින සභා සම්මතිය අනුව අ.භා. 5.55 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 08 සිකුරාදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.